විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2010 දිනය / திகதி / Date 2010.07.27

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 6/2010 ( සංශෝධන I )**

දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්
ත්‍රිවිධ හමුදාපතිවරුන්.

**සන්නද්ධසේවා නිලධාරීන් හා සෙසු නිලයන් සඳහා**
**<u>පූර්ණ විශ්‍රාම වැටුප් ලබාදීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මවිසින් නිකුත් කරන ලද 2010.07.16 දිනැති වි.වැ. චක්‍රලේඛ 6/2010 ට ඌන පූරණයක් වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

1. එම චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන්නේ 2010.01.01 දින සිටය.

2. 2009.05.19 දින සිට 2009.12.31 දින දක්වා කාල සීමාව තුල විශ්‍රාම ගොස් සිටින සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන් සඳහාද නව ප්‍රතිශතය අනුව සංශෝධිත පරිවර්තිත පාරිතෝෂිකය හිමිවේ.

3. ත්‍රස්තවාදී හේතු හා නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ආබාධ හේතුවෙන් වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වූ නිලධාරීන්/නිලධාරිනියන්, සාමාජිකයන්/සාමාජිකාවන් සඳහා තව දුරටත් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2009 විධි විධාන බල පැවැත්වේ.

4. 2009.05.19 දිනෙන් පසු සේවයේ යෙදී සිටියදී මියගිය/ මියයන සන්නද්ධ සේවා නිලධාරීන්/නිලධාරිනියන් හා සෙසු නිලයන් වෙනුවෙන් මරණ පාරිතෝෂිකය සකස් කිරීම සඳහා ප්‍රතිශතය පදනම් කර ගැනීමේදී ඔවුන් මිය යන අවස්ථාව වන විට හිමිව තිබූ ප්‍රතිශතයට අතිරේක 15% ක් එකතු කොට මරණ පාරිතෝෂිකය ගණනය කල යුතුය.



| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

5. ක්‍රියාන්විත රාජකාරියේ වසර 05 ක් සපුරා ඇති නිත්‍ය/ස්වේච්ඡා බලසේනා නිලධාරීන්/නිලධාරිණියන්, සාමාජිකයන්/සාමාජිකාවන්ගේ වෙනත් සේවා කාලයක් විශ්‍රාම වැටුප් ගණනයට එකතු කර ඇත්තේ නම් එම සේවා කාලයද ප්‍රතිශත ගණනයට පාදක කර ගත හැකිය.

**කේ. ඒ. තිලකරත්න.**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් -

1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. ලේකම් - රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
4. ලේකම් - මුදල් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
5. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
6. සන්නද්ධ හමුදා විශ්‍රාමික සංගම්
7. විගණකාධිපති